# 7 තරින්දගේ උපන් දිනය

කීචි............... බීචි................... කීචි....................... බීචි ලස්සන කුරුලු ගීතයක් ඇසුණා. ඒ හඬින් තරින්ද අවදි වුණා. ජනේලය ළඟට ආවා. ජනේලය ඇරලා වටපිට බැලුවා.

කවුදෝ කෙනෙක් තමා ළඟට එනවා වගේ තරින්දට දැනුණා. ඔහු ඉක්මනට පිටුපස හැරී බැලුවා.

"සුබ උපන්දිනයක් මගෙ පුතාට" තරින්දගේ අම්මා එහෙම කියලා ඔහුගේ මුහුණ සිප ගත්තා.

"අද සවසට අපි පන්සල් යමු. මල් පහන් පූජා කරලා බෝධි පූජාවක් තියමු". අප්පච්චි කීවා.

තරින්ද සතුටින් කැමති වුණා.

සවස සියලුදෙනා ම පන්සලට ගියා.

"ආ............... අන්න ලොකු හාමුදුරුවෝ මේ පැත්තට වඩිනවා." අම්මා කිව්වා.

"අපි මල් පහන් පුජා කරන්න ඉස්සරවෙලා ලොකු හාමුදුරුවෝ හමුවෙමු.

හොඳයි, අපි ගිහින් උන් වහන්සේ බැහැදැකලා එමු. අන්න, උන්වහන්සේ විහාරගේ පැත්තටයි වඩින්නේ."

සියලුදෙනා ම ලොකු හාමුදුරුවන්ට නමස්කාර කළා. සුවපත් වේවා! යැයි ලොකු හාමුදුරුවෝ පැවසුවා.

"ආ...... උපාසක උන්නැහේ. මොකද අද දූ දරුවොත් එක්ක මේ පැත්තේ........ ?" ලොකු හාමුදුරුවෝ ඇසුවා.

"ලොකු හාමුදුරුවනේ,! අද අපේ පුතාගේ උපන් දිනය........." අප්පච්චි කිව්වා.

"මේවාගේ යහපත් වැඩවලින් සිත පිරිසිදු වෙනවා. දෙමවුපිය නෑ හිතමිතුරන් අතරේ බැඳීම වැඩිවෙනවා."

"එහෙමයි අපේ හාමුදුරුවනේ..........."

"මම එහෙනම් ආවාස ගේ පැත්තට ගිහින් එන්නම්. ඔයගොල්ලෝ ඔය මල් පහන් සූදනම් කරගන්න."

"එහෙමයි........... හාමුදුරුවනේ."

"පුතේ, ඉෂාර අයියත් එක්ක ගිහිල්ලා ඉදලක් හොයාගෙන එන්න." අප්පච්චි කිව්වා. "අන්න පොඩි හාමුදුරුවෝ බෝ මළුව අමදිනවා."

"එන්න..... එන්න..... අපි ගිහිල්ලා බෝ මළුව අතු ගාමු." තරින්දයි ඉෂාරයි රටාවකට බෝ මළුව අතුගෑවා.

"දුවේ, ...... ඔය මල්වලට පැන් ඉස්සා ද?" අම්මා සඳුනි අක්කාගෙන් ඇසුවා. "තව ම නැහැ නැන්දේ" සඳුනි අක්කා පිළිතුරු දුන්නා. "එහෙනම් නංගිලා, මල්ලිලා එක්ක ගිහින් අත් දෝවනය කරගෙන මල්වලටත් පැන් ඉහගෙන එන්න."

"එන්න, එන්න, හැමෝම එන්න. අපි අත් සෝදමු."

"මනිල්ක මල්ලි ඔය මල් වට්ටි මෙහාට ගෙනෙන්න. ආ ....... අත් දෝවනය කරලා...... මල්වලට පැන් ඉහින්න." සඳුනි අක්කා කිව්වා.

හංසියි, දෝනියි පහන්වලට තිර දමා සකස් කළා.

පොල් තෙල් දැම්මා.

ලොකු මාමායි, ලොකු නැන්දයි සුවඳ කුරු පත්තු කරන්න සූදානම් කළා.

ආත්තම්මා ගිලන්පස බුද්ධ පූජාව සකස් කළා.



සියලුදෙනා ම එකතු වෙලා මල් පූජා කළා. පහන් පත්තු කළා. සුවඳ කූරු දැල්වුවා. මල්මාලාව බෝධීන් වහන්සේට පැළඳුවා. කොඩිවැලත් එල්ලුවා.

හැමෝම බිම වාඩි වී සිටියා. ලොකු හාමුදුරුවෝ රැස් ව සිටි පිරිස පන්සිල්හි පිහිටෙව්වා. ගාථා කියෙව්වා. සෙත් පිරිත් දේශනා කළා, බණ කිව්වා. ආත්තම්මා ගිලන්පස ලොකු හාමුදුරුවන්ට පිළිගැන්වුවා. "මම අර ගල උඩ තියෙන විහාර ගේ පැත්තට ගිහිල්ලා එන්නම්. ගිලන්පස ආවාස ගෙයින් තියන්න."

"එහෙමයි, අපේ හාමුදුරුවනේ. එහෙනම් ඔබ වහන්සේ පසු ව ගිලන්පස වළඳන්න." ආත්තම්මා නැවතත් මතක් කළා. සියලුදෙනා ම ලොකු හාමුදුරුවන්ට දණ ගසා වැන්ද?

## ක්‍රියාකාරකම : 1

i. පාඩම නිශ්ශබ්ද ව කියවන්න.
ii. පාඩම සංවාදයක් ලෙස ඉදිරිපත් කරන්න.

## ක්‍රියාකාරකම : 2

වැඩිහිටියකු සමග කරන කතාබහක් සංවාද ආකාරයෙන් සකස් කර ඔබේ මිතුරා සමග පන්තියේ රඟ දක්වන්න.

## ක්‍රියාකාරකම : 3

පහත සඳහන් මාතෘකා යටතේ අවස්ථානුකූල ව විවිධ පුද්ගලයන් සමග කතාබහේ යෙදෙන ආකාරය රඟ දක්වන්න.

i. පාසලේ දී
ii. කෝවිලේ දී
iii. පල්ලියේ දී
iv. බැංකුවේ දී
v. රෝහලේ දී

## ක්‍රියාකාරකම : 4

i. තරින්දගේ උපන්දිනය වෙනුවෙන් පවුලේ අය පන්සලට පැමිණීම ගැන හාමුදුරුවන් පැවසුවේ කුමක් ද?

ii. පන්සල් භූමියක දී සිදුවන කතාබහේ දී භාවිත වන පාඩමේ යෙදී නොමැති වෙනත් වචන සොයා ලැයිස්තුවක් සකස් කරන්න.

iii. කෝවිලේ දී, පල්ලියේ දී භාවිත කරන එවැනි විශේෂ වචන ලැයිස්තු ගත කරන්න.

## ක්‍රියාකාරකම : 5

පහත සඳහන් වාක්‍යවල හිස් තැන් පාඩම ඇසුරෙන් සම්පූර්ණ කරන්න.

i. ලස්සන කුරුලු ........................................ ඇසුණා.

ii. .................................. දිනයක් මගෙ පුතාට.

iii. අද හවසට අපි .................................... යමු.

iv. සවස සියලු දෙනා ම .................................... ගියා.

## ක්‍රියාකාරකම : 6

(1) පහත දැක්වෙන ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුරු වරහන් තුළින් තෝරන්න.

i. මෙදින යෙදී තිබුණේ කාගේ උපන් දිනය ද?
(චමුදිගේ / ඉෂාරගේ / තරින්දගේ)

ii. බෝමළුව අමදිමින් සිටියේ කවුද?
( මම / පොඩි හාමුදුරුවෝ / ලොකු හාමුදුරුවෝ )

(2) හිස් තැනට ගැළපෙන පදය වරහන් තුළින් තෝරන්න.

i. ලොකු හාමුදුරුවෝ ගිලන්පස ..............................
( බොනවා / වළඳනවා / කනවා )

ii. අපි මල්, සුවඳකුරු, ගිලන්පස හා දැහැත් ..................................
( බලා ගනිමු / පූජා කරමු / දෙමු )

## ක්‍රියාකාරකම : 7

පහත සඳහන් විශේෂ යෙදුම්වල අර්ථය දෙන වචනය කොටුවෙන් තෝරා ලියන්න.

| | | | |
|---|---|---|---|
| ගමන් කරනවා, | වතුර, | අත් සෝදනවා, | කනවා, |
| දෙනවා, | අතුගානවා | | |

i. පැන් -

ii. අත්දෝවනය කරනවා -

iii. අමදිනවා -

iv. වඩිනවා -

v. පිළිගන්වනවා -

vi. වළඳනවා -